12
පාඩම
द्वादशः पाठः

# විභක්ති - V
## (චතුර්ථී විභක්තිය)

### චතුර්ථී විභක්තිය

शिष्य - සිසු    शिष्याय - සිසුවාට

උදා : गुरुः शिष्याय पुस्तकं वितरति ।
ගුරුවරයා ශිෂ්‍යාට පොතක් දෙයි.

उपासकः भिक्षवे चीवरं पूजयति ।
උපාසකයා භික්ෂුවට සිවුරක් පූජාකරයි.

अग्रजः कपये फलं यच्छति ।
අයියා වඳුරාට ගෙඩියක් දෙයි.

उदक - දිය    उदकाय - දිය පිණිස

උදා : माता उदकाय कूपं गच्छति ।
මව දිය පිණිස ළිඳට යයි.

भिक्षुः पिण्डाय ग्रामं व्रजति ।
භික්ෂුව පිඬු පිණිස ගමට වඩියි.

सेनापतिः युद्धाय संग्रामभूमिं प्रविशति ।
සෙන්පති යුද පිණිස රණබිමට පිවිසෙයි.

5. **नमः** (නමස්කාර වේවා) **स्वस्ति** (සෙත් වේවා) යන නිපාත සමග යෙදෙන නාමයන් ද චතුර්ථී විභක්තියෙන් යෙදේ.

උදා: **नमः समन्तभद्राय ।** - බුදුරජාණන්වහන්සේට නමස්කාර වේවා.

**स्वस्ति गुरवे ।** - ගුරුවරයාට සෙත් වේවා.

## අවධානයට

ඉහත පාඩම්වල වරනැඟුණු ශබ්ද චතුර්ථී විභක්තියේ වෙනස් ව වරනැඟෙන අයුරු වටහාගන්න.

| शब्द | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक | बालकाय | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාට | ළමයි දෙදෙනාට | ළමයින්ට |
| कवि | कवये | कविभ्याम् | कविभ्यः |
| | කවියාට | කවියන් දෙදෙනාට | කවියන්ට |
| साधु | साधवे | साधुभ्याम् | साधुभ्यः |
| | සත්පුරුෂයාට | සත්පුරුෂයන් දෙදෙනාට | සත්පුරුෂයන්ට |
| पितृ | पित्रे | पितृभ्याम् | पितृभ्यः |
| | පියාට | පියවරුන් දෙදෙනාට | පියවරුන්ට |

## වරනැඟීම

### 12.1 ක්‍රියාකාරකම

ආකාරාන්ත ස්ත්‍රීලිංග **वनिता** ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | वनिता | वनिते | वनिताः |
| | ස්ත්‍රිය | ස්ත්‍රීහු දෙදෙන | ස්ත්‍රීහු |
| सम्बोधन | हे वनिते | हे वनिते | हे वनिताः |
| | පින්වත් ස්ත්‍රිය | පින්වත් ස්ත්‍රීහු දෙදෙනනි | පින්වත් ස්ත්‍රියනි, |
| द्वितीया | वनिताम् | वनिते | वनिताः |
| | ස්ත්‍රිය | ස්ත්‍රීන් දෙදෙනා | ස්ත්‍රීන් |
| तृतीया | वनितया | वनिताभ्याम् | वनिताभिः |
| | ස්ත්‍රිය විසින් | ස්ත්‍රීන් දෙදෙනා විසින් | ස්ත්‍රීන් විසින් |
| चतुर्थी | वनितायै | वनिताभ्याम् | वनिताभ्यः |
| | ස්ත්‍රියට | ස්ත්‍රීන් දෙදෙනාට | ස්ත්‍රීන්ට |
| पञ्चमी | वनितायाः | वनिताभ्याम् | वनिताभ्यः |
| | ස්ත්‍රියගෙන් | ස්ත්‍රීන් දෙදෙනාගෙන් | ස්ත්‍රීන්ගෙන් |
| षष्ठी | वनितायाः | वनितयोः | वनितानाम् |
| | ස්ත්‍රියගේ | ස්ත්‍රීන් දෙදෙනාගේ | ස්ත්‍රීන්ගේ |
| सप्तमी | वनितायाम् | वनितयोः | वनितासु |
| | ස්ත්‍රිය කෙරෙහි | ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි | ස්ත්‍රීන් කෙරෙහි |

## වරනැඟීම

### 12.2 ක්‍රියාකාරකම

ස්ත්‍රීලිංග **वनिता** ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද වරනගමු.

**अम्बा** - මව　**बालिका** - බාලිකාව　**सुता** - දියණිය

**कन्या** - කන්‍යාව　**ललना** - ස්ත්‍රිය　**जाया** - බිරිඳ

| | | | | | |
|---|---|---|---|---|---|
| कृपा | - කරුණාව | पर्णशाला | - පන්සල | शोभा | - සෝබාව |
| श्रद्धा | - ශ්‍රද්ධාව | प्रज्ञा | - නුවණ | छाया | - සෙවණැල්ල |
| दया | - දයාව | वसुधा | - පොළොව | लङ्का | - ලංකාව |
| दिशा | - දිශාව | प्रतिमा | - පිළිමය | नौका | - නැව |
| शाखा | - අත්ත | शय्या | - ඇඳ | प्रजा | - ප්‍රජාව |
| सभा | - සභාව | कथा | - කතාව | वार्ता | - ප්‍රවෘත්තිය |
| वालुका | - වැල්ල | तारका | - තරුව | वाटिका | - ගෙවත්ත |
| मेधा | - නුවණ | क्षुधा | - බඩගින්න | पिपासा | - පිපාසාව |
| भार्या | - බිරිඳ | प्रमदा | - ගැහැණිය | उपासिका | - උපාසිකාව |
| शिला | - ගල | निशा | - රැය | पाठशाला | - පාසල |

## 12.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ශබ්දවල **චතුර්ථී විභක්ත්‍යන්ත** පද ලියා දක්වන්න.

| शब्द | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| උදා: गज | - | गजाय | गजाभ्याम् | गजेभ्यः |
| १ नृप | - | ........................ | ........................ | ........................ |
| २ मार्जार | - | ........................ | ........................ | ........................ |
| ३ सारथि | - | ........................ | ........................ | ........................ |
| ४ शिशु | - | ........................ | ........................ | ........................ |
| ५ अरि | - | ........................ | ........................ | ........................ |
| ६ सूनु | - | ........................ | ........................ | ........................ |
| ७ गन्तृ | - | ........................ | ........................ | ........................ |
| ८ सुता | - | ........................ | ........................ | ........................ |
| ९ कन्या | - | ........................ | ........................ | ........................ |

2. පහත දැක්වෙන **චතුර්ථී විභක්ත්‍යන්ත** පදවල වචනය (ඒක/ද්වි/බහුවචන බව) හා තේරුම ලියා දක්වන්න.

| | | වචනය | අර්ථ |
|---|---|---|---|
| १ वाणिजाय | - | .............................. | ................................ |
| २ दरिद्रेभ्यः | - | .............................. | ................................ |
| ३ ऋषये | - | .............................. | ................................ |
| ४ सारथिभ्याम् | - | .............................. | ................................ |

५ बन्धवे - .............................. ..............................

६ विधात्रे - .............................. ..............................

७ सूनुभ्यः - .............................. ..............................

८ भर्तृभ्याम् - .............................. ..............................

९ बालिकायै - .............................. ..............................

१० प्रमदाभ्यः - .............................. ..............................

## 12.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නඟන්න.

१ सुता मार्जाराय अन्नं वितरति ।

२ भृत्यः वृषभाय जलं ददाति ।

३ दायकाः यतिभ्यः दानं वितरन्ति ।

४ अमात्यः कृषीवलेभ्यः खनित्राणि प्रयच्छति ।

५ जनाधिपः उत्सवाय रथेन व्रजति ।

६ नृपतिः वनितायै वस्त्रं प्रयच्छति ।

७ बालिका पुष्पाय उद्यानं गच्छति ।

८ गुरुः शिष्याय त्यागं वितरति ।

९ नमो ऋषये ।

१० स्वस्ति महाशयाय ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

1. ගුරුවරයාට නමස්කාර වේවා.
2. වෙළෙන්දා **සේවකයන්ට** වැටුප් දෙයි.
3. මුණුබුරා සැමදා **සීයාට** කෑම දෙයි.
4. ප්‍රභූවරයා **ආගන්තුකයන්ට** ආහාර දෙයි.
5. මව තරුණිය සමග **ජලය පිණිස** නදියට යයි.
6. උපාසිකාව ශ්‍රද්ධාවෙන් **බුදුන්ට** මල් පුදයි.
7. පියා **පුතුට** රසකැවිලි දෙයි.
8. අයියා **මල්ලීට** තෑග්ගක් දෙයි.
9. අනුන්ට පෙළීම **පව් පිණිස** වේ.
10. අනුන්ට උපකාර කිරීම **පිං පිණිස** වේ.

## අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| तुष्यति | - සතුටුවෙයි | प्रविशति | - පිවිසෙයි | वितरति | - දෙයි |
| ददाति | - දෙයි | प्रयच्छति | - දෙයි | स्पृहयति | - රුචි කරයි |
| पूजयति | - පුදයි | रुष्यति | - කිපෙයි | उपदिशति | - උගන්වයි |

නාමපද

| | | | |
|---|---|---|---|
| अमात्य (පු) | - ඇමති | जनाधिप (පු) | - ජනපති |
| उत्सव (පු) | - උත්සවය | दारक (පු) | - දරුවා |
| भृत्य (පු) | - සේවකයා | पितामह (පු) | - සීයා |
| मार्जार (පු) | - බළලා | महाशय (පු) | - මහාත්මා |
| अन्न (න) | - ආහාර | दान (න) | - දානය |
| काष्ठ (න) | - දර | पुष्प (න) | - මල |
| खनित्र (න) | - උදැල්ල | वेतन (න) | - වැටුප |
| शास्त्र (න) | - ශිල්ප | सर्वदा (නි) | - සදා |

භාවිතයට

**परोपकाराय फलन्ति वृक्षाः - परोपकाराय वहन्ति नद्यः ।**
**परोपकाराय दुहन्ति गावः - परोपकारार्थमिदं शरीरम् ॥**

අනුනට වැඩ පිණිස ගස් පලදරයි. අනුනට වැඩ පිණිස ගංගා ගලාබසී. ගවයෝ අනුනට වැඩ පිණිස කිරි දෙත්. මේ ශරීරය ද අනුනට වැඩ පිණිස ම වේ.